# බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහ නගර සභාවේ විධායක සේවා ගණයේ උද්‍යාන විද්‍යාඥ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත කරඟ විභාගය 2024

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහ නගර සභාවේ විධායක සේවා ගණයේ උද්‍යාන විද්‍යාඥ III ශ්‍රේණියට බඳවා ගැනීමේ (සීමිත) තරඟ විභාගය සඳහා පහත සුදුසුකම් ලත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ, සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**02.** **වැටුප් පරිමාණය**

මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රා.ප.ච 03/2016 අනුව රු.47,615-10×1335-8×1630- 17x2170 - 110,895/- වේ. වැටුප් කේත අංකය SL 1-2016 වේ.

**03.** **සේවා කොන්දේසි**

i) අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව සේවා කොන්දේසි තීරණය වේ.

ii) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදි ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුය.

iii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයටද, රජයේ හා බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසි වලටද, රජයේ හා බස්නාහිර පළාත් සභාවේ වෙනත් රෙගුලාසි වලටද, චක්‍රලේඛ හා උපදෙස් වලටද, ඒවාට අදාළ වරින් වර නිකුත් කරනු ලබන සංශෝධන වලටද ඔබ යටත් විය යුතු වේ.

**04.** **පවත්නා පුරප්පාඩු ක්ෂේත්‍රයන්**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහ නගර සභාවේ විධායක සේවා ගණයේ උද්‍යාන විද්‍යාඥ III ශ්‍රේණියේ උද්‍යාන විද්‍යාඥ තනතුරෙහි මුළු පුරප්පාඩු 01 ක් පවතී. 100% අභ්‍යන්තරව බඳවාගැනීම සිදුකළ යුතුය. මෙම තනතුරෙහි පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

4.1 අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2024-08-25 දින වේ.

**05.** **සුදුසුකම්:**

**I.** **අධ්‍යාපන සුදුසුකම් -**
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් උද්‍යාන විද්‍යාව විෂයක් ලෙස ඇතුලත් කෘෂිකර්ම විද්‍යාවේදී උපාධිය හෝ උද්භිද විද්‍යාව විෂයක් ලෙසඇතුලත් විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම

**II.** **වෘත්තීය සුදුසුකම්:**
අදාල නොවේ

**III.** **කායික සුදුසුකම් :**
තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වීම.

**IV.** **පළපුරුද්ද :**
බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ MN-3හෝ ඊට වැඩි වැටුප් ඛණ්ඩයක් හිමි උද්‍යාන විද්‍යාව පිළිබඳ විෂය ක්ෂේත්‍රයකට අදාල තනතුරක වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් තිබීම හා අදාල තනතුරෙහි ස්ථිර කර තිබීම

**V.** **වයස් සීමාව :**
බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන් බැවින් උපරිම වයස් සීමාවක් අදාළ නොවේ.

06. බඳවා ගැනීමේ ක්‍රමය:

බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2019.10.28 දිනැතිව අනුමත කරන ලද බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහ නගර සභාවේ විධායක සේවා ගණයේ උද්‍යාන විද්‍යාඥ තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියට අනුව ලිඛිත පරීක්ෂණයක් පවත්වා එහිදී ලබා ගන්නා ලකුණු අනුපිළිවෙල මත සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් 100% සීමිත පදනම මත බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

- සීමිත අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පිරවීමට නොහැකි වන අවස්ථාවලදී පමණක් විවෘතව අයදුම්පත් කැඳවා පුරප්පාඩු පුරවනු ලැබේ.

තවද, 2020.01.20 දිනැතිව පළ කර ඇති අභ්‍යන්තර නිවේදනය අනුව අයදුම්පත් යොමු කළ අයදුම්කරුවන් නැවත අයදුම්පත් යොමු කිරීම අවශ්‍ය නොවේ.
මෙම තනතුර සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු දිනය 2024-08-25 දින වේ.

**I. ලිඛිත පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර 02කින් යුක්ත වේ.**

| ප්‍රශ්න පත්‍රය / විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනුම | පැය 01 | 100 | 40 |
| විෂයානුබද්ධ අධ්‍යනය | පැය 02 | 100 | 40 |

**II. විභාගය සඳහා වන විෂය නිර්දේශය**

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනුම | තර්කන ශක්තිය, ගණිත කුසලතාවයන්,තාර්කික තීරණ ගැනීම හා කාලය කළමනාකරණය කිරීම පිළිබඳ ඇගයීමේ බහුවර්ණ ප්‍රශ්න පත්‍රයකි. |
| විෂයානුබද්ද අධ්‍යනය | විවිධ ශාක වර්ග රෝපණය කිරීම පිළිබඳ දැනුම, මල් වගාව හා උද්‍යාන අලංකරණය පිළිබඳ ක්‍රියාකාරකම්වල දේශගුණික තත්වයන් සඳහා උචිත ශාක වර්ග හඳුනා ගැනීම, ශාක හෝ වෘක්ෂ පිරියම් කිරීම සම්බන්ධ දැනුවත්භාවය ඇගයීමේ ප්‍රශ්න පත්‍රයකි. |

**07. විභාග ගාස්තු:**

සෑම අයදුම්කරුවෙකුම විභාග ගාස්තුවක් බස්නාහිර පළාත් සභාවට ගෙවිය යුතුය. මෙම විභාගය සඳහා විභාග ගාස්තුව රු.1200/-කි. විභාග ගාස්තුව, බස්නාහිර පළාත් සභා ආදායම් ශීර්ෂ 20-03-02-99 ට බැර වන ලෙස අයදුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනට හෝ ඊට ප්‍රථම, බස්නාහිර පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඔබගේ නමින් ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා තිබිය යුතුය. එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත්වනු ඇත. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් සමුපූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ. තවද, විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

**08. විභාගයට ඇතුල්වීම:**

(අ) නිවැරදිව අයදුම්පත් යොමු කර ඇති සියලුම අයදුම්කරුවන් වෙත බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටිය යුතු අතර, එසේ පෙනී සිටින පළමු දිනයේදීම තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනු ඇත.

09. අපේක්ෂකයාගේ අනන්‍යතාවය:

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයන් විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

i) වලංගු ජාතික හැඳුනුම්පත
ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

10. සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම:

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන අතරතුරදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය විසින් උවමනාවෙන්ම යටපත් කර ඇති නම්, ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත. මේ සම්බන්ධව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ 47 වගන්තිය ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.

11. විභාග ක්‍රමය:

i) අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු ලිවිය යුතු ය.
ii) මෙම විභාගය දන්වනු ලබන ඉදිරි දිනයකදී පවත්වනු ලැබේ.

12. අයදුම් කිරීමේ ක්‍රමය:

(අ) අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපසම භාවිතා කරමින් A4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙළ කර අපේක්ෂකයා තම අත් අකුරින්ම පැහැදිලිව පිරිවිය යුතුය.

(ආ) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2024-08-25 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 628, 10 වන මහල, ජන ජය සිටි ගොඩනැගිල්ල, නාවල පාර, රාජගිරිය" වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහ නගර සභාවේ විධායක ගණයේ උද්‍යාන විද්‍යාඥ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය" යන්න පැහැදිලි ලෙස සඳහන් කර තම ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා, අමාත්‍යාංශ ලේකම් මඟින් ඔවුන්ගේ නිර්දේශ සහිතව එවිය යුතුය. නියමිත දිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාරගනු නොලැබේ.

13. **අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වේ.**

14. **මෙම දැන්වීම හා ආදර්ශ අයදුම් පත්‍රය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේද පළ කර ඇත.**

තිලක් සෙනරත්,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.
2024.07. 24

ආදර්ශ අයදුම්පත්‍රය

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහ නගර සභාවේ විධායක නිලධාරි ගණයේ උද්‍යාන විද්‍යාඥ III ශ්‍රේණියට බඳවා ගැනීමේ (සීමිත) තරඟ විභාගය

විභාග අංකය [ ]
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාල අක්ෂරය කොටුව තුළ ලියන්න)

සිංහල - S
දෙමළ - T
ඉංග්‍රීසි - E

1.

1.1. සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : ..........................................................................................

( උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2. මුලකුරු සමඟ අගට යෙදෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

..........................................................................................................................................

(උදා : H.M.S.K.GUNAWARADHANA)

1.3. සම්පූර්ණ නම (සිංහලෙන් / දෙමළෙන්) - ..........................................................................................

1.4. ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

2.

2.1. දැනට දරණ තනතුර : ..........................................................................................

2.2. එම තනතුර ස්ථිරද, තාවකාලිකද, අනියම්ද යන්න : ..........................................................................................

2.3. එම තනතුරට පත්වීමේ දිනය : ..........................................................................................

2.4. සේවය ස්ථිර කළ දිනය : ..........................................................................................

2.5. අයදුම්පත් භාර ගන්නා අවසන් දිට පූර්වාසන්න වසර 05ක කාලසීමාව තුළ විනය ක්‍රියාමාර්ගයට ලක් වී තිබේද? - ඔව් / නැත

2.6. ඉහත 2.5ට පිළිතුර " ඔව් " නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න

..........................................................................................................................................

2.7. බස්නාහිර පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කළ දිනය : ..........................................................................................

2.8. සේවා ස්ථානයේ නම සහ ලිපිනය : ..........................................................................................

2.9. වැටුප් බණ්ඩය : ..........................................................................................

2.10. පලපුරුද්ද : (අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 03 අනුව සේවා පලපුරුද්ද පිළිබඳ පහත වගුව සම්පූර්ණ කරන්න.)( නිලධාරියාගේ රාජකාරී ලයිස්තු සත්‍ය පිටපත් ලෙස සහතික කර ඇමිණිය යුතුය)

| දරණ ලද තනතුර | සේවා ස්ථානය | වැටුප් බණ්ඩය | කාල සීමාව |
|---|---|---|---|
| | | | |
| | | | |

3.

3.1. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : ..........................................................................................

..........................................................................................................................................................

3.2. ස්ථිර ලිපිනය (සිංහලෙන් / දෙමළෙන්) : ..........................................................................................

..........................................................................................................................................................

3.3. විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :

3.3.1. සිංහලෙන්/ දෙමළෙන් : ..........................................................................................

3.3.2. ඉංග්‍රීසි කැපිටල් අකුරින් : ..........................................................................................

3.4. දුරකථන අංකය : රාජකාරී : .............................. පෞද්ගලික : ..............................

❖ විභාගය සම්බන්ධ සියළු තොරතුරු ඉහත සඳහන් කරනු ලබන ජංගම දුරකතන අංකයට SMS ක්‍රමය මඟින් යොමු කරන බැවින් වලංගු දුරකතන අංකය සඳහන් කරන්න.

4. ස්ත්‍රී / පුරුෂ භාවය - (අදාල කොටුව තුළ √ ලකුණ යොදන්න)

පුරුෂ - ☐ ස්ත්‍රී - ☐

5.

5.1. විවාහක / අවිවාහක බව - (විවාහක - 1 , අවිවාහක - 2) ☐
(අදාල කොටුව තුළ ලියන්න)

5.2. උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

5.3. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු: .................. මාස ............... දින ................

6. උපාධිය පිළිබඳ විස්තර (උපාධිය සහතිකයේ හා සවිස්තරාත්මක සහතිකයේ (Detailed Certificate) පිටපත් ඇමිණිය යුතුයි.)

6.1. ලබා ඇති උපාධිය : ..........................................................................................

6.2. උපාධියේදී හදාරණ ලද විෂයයන් : ..........................................................................................

6.3. උපාධි සහතිකය වලංගු දිනය : ..........................................................................................

7. 2024............ දිනට සක්‍රීය හා සතුටුදායක සේවා කාලය තුළ දැනට දරණ තනතුරේ,

7.1. සියළුම වැටුප් වර්ධක උපයාගෙන තිබේද? ..........................................................................................

7.2. වැටුප් රහිත/ වැටුප් රහිත විදේශ නිවාඩු ලබා තිබේද? ..........................................................................................

7.3. ඔබට විරුද්ධව විනයානුකූලව කටයුතු කර තිබේද?, විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර තිබේද?,

..........................................................................................................................................................

7.4. ඉහත 7.3 සඳහා පිළිතුර "ඔව්" නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න ..........................................................................................

..........................................................................................................................................................

8. විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය : ..........................................................................................

8.1. ලදුපත් අංකය : ..........................................................................................

8.2. දිනය : ..........................................................................................

| ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න |
| --- |

9. අයදුම්කරුගේ සහතිකය

...........................................................................................................................................................................

.................................... වන මා විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයාගනු ලැබුවහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහ නගර සභාවේ විධායක නිලධාරී ගණයේ උද්‍යාන විද්‍යාඥ III ශ්‍රේණියේ තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමටද කටයුතු කරනු ලැබීමටද හැකි බව මම හොඳාකාරවම දනිමි.

..........................................................................

දිනය: ....................................

නිලධාරියාගේ අත්සන

10. <u>ආයතන ප්‍රධානියාගේ නිර්දේශය</u>

මෙම ආයතනයේ සේවයේ නියුතු ........................................................................... මයා/ මිය / මෙනවියගේ පෞද්ගලික ලිපිගොණුව අනුව ............................................ දින සිට බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ .................................... තනතුරක සේවය කරන බවත් MN – 03 වැටුප් බණ්ඩයේ / ඊට ඉහල වැටුප් බණ්ඩයක වැටුප් ලබන බවත් .................................... දින සිට සේවය ස්ථිර කර ඇති/නැති බවත් ............................................... දිනට වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති/නැති බවත් වැටුප් රහිත නිවාඩු ලබා ගෙන ඇති/නැති බවත්, ඔහුට/ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කර නොමැති/ඇති බවත්, විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර නොමැති/ඇති බවත් සහතික කරමි.

2. අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති විස්තර නිවැරදි බව සහතික කරන අතර අදාල බවා ගැනීමේ පරිපාටිය අනුව මෙම නිලධාරිනිය/නිලධාරියා සුදුසුකම් සපුරා ඇති බව නිර්දේශ කරමි.

දිනය-........................................

.........................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව

11. <u>දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය</u>

බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහ නගර සභාවේ විධායක නිලධාරී ගණයේ උද්‍යාන විද්‍යාඥ තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව ....................................... මයා/ මිය / මෙනවිය සුදුසුකම් සපුරා ඇති බැවින් අයදුම්පත නිර්දේශ කරමි.

දිනය-........................................

.........................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව

12. <u>ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය</u>

ඉහත සඳහන් නිර්දේශය සමග එකඟ වෙමි / නොවෙමි.

දිනය-........................................

.........................................................

ප්‍රධාන ලේකම් (බ.ප.)ගේ අත්සන හා නිලමුද්‍රාව